

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඌ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තුන්වන වාර්තාව

2023 වර්ෂයේ දෙසැම්බර් සිට 2024 වර්ෂයේ මැයි දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் 41 ஏ (1) எனும் உறுப்புரையின் பிரகாரம் சமர்ப்பிக்கப்பட்ட அரசியலமைப்புப் பேரவையின் மூன்றாவது அறிக்கை

2023 டிசம்பர் தொடக்கம் 2024 மே வரையான காலப்பகுதிக்கானது

The Third Report of the Constitutional Council submitted in terms of Article 41G (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

For the period from December 2023 to May 2024

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තුන්වැනි වාර්තාව

2023 වර්ෂයේ දෙසැම්බර් සිට 2024 වර්ෂයේ මැයි දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා

අන්තර්ගතය

1. හැඳින්වීම 1

2 සභාවේ රැස්වීම් 1

3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති කොමිෂන් සභා සඳහා සාමාජිකයන් වශයෙන් පත් කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම 1

3.1 මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම සඳහා වූ නිර්දේශය 1

3.2 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ 2

3.3 ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම 2

4 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ අනුමත කිරීම් / නොකිරීම් 3

4.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු පත් කිරීම 3

4.2 අභියාචනාධිකරණයේ සභාපති වශයෙන් වැඩ බැලීම සඳහා පත් කිරීම 3

4.3 අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු පත් කිරීම 3

4.4 පොලිස්පති ධුරය සඳහා පත් කිරීම 4

4.4.1 පොලිස්පති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම 4

4.4.2 පොලිස්පති ධුරයට ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය 4

5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර අනෙකුත් ලිඛිත නීති මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පනවන ලද හෝ පවරන ලද කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම 5

5.1 සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජික ධුරයකට පත් කිරීම 5

5.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා සාමාජිකයින් පත් කිරීම 5

5.3 අධිභාර අභියාචනා කමිටුව සඳහා සාමාජිකයකු පත් කිරීම 5

5.4 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කිරීම 6

5.5 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) සඳහා සාමාජිකයින් පත් කිරීම 6

6 සභාවේ කාර්යය හා කර්තව්‍ය කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් වූ රීති සකස් කිරීම 6

7 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා වූ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම 7

8 සභාවේ සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත්‍රවල යොමු අංක 7

1. හැඳින්වීම

(මෙහි මින් මතු ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ' ප්‍රතිපාදන යටතේ (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව' වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති මගින් පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යන් කිරීම හා ඉටු කිරීම පැවරී තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාවට අනුකූලව මෙම වාර්තාව මගින් 2023 දෙසැම්බර් මාසයේ සිට 2024 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඉෂ්ට සිද්ධ කරන ලද කටයුතු පිළිබඳ විස්තර ඉදිරිපත් කරනු ලැබේ.

2. සභාවේ රැස්වීම්

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දහසය (16) වාරයක් පහත දිනයන්හිදී රැස් වී තිබේ:-

2023.12.01, 2023.12.05, 2023.12.10, 2023.12.12, 2023.12.30, 2024.01.02, 2024.01.12, 2024.01.19, 2024.01.30, 2024.02.19, 2024.02.26, 2024.03.21, 2024.04.02, 2024.04.25, 2024.05.08 සහ 2024.05.14 යන දිනයන් ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති කොමිෂන් සභා සඳහා සාමාජිකයන් වශයෙන් පත් කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම

3.1. මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම සඳහා වූ නිර්දේශය

සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (3) සහ 103 ව්‍යවස්ථාවන්හි විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කිරීම සඳහා මුලින් තැනැත්තන් සිව් (04) දෙනකු නිර්දේශ කරනු ලැබ තිබුණි.

ඒ අනුව, සභාව විසින් මැතිවරණ කොමිෂන් සභාවේ ඉතිරි (01) සාමාජික ධුරය සඳහා නිර්දේශ කරනු පිණිස අයදුම්කරුවන්/නාමයෝජිතයින් පිළිබඳව සලකා බැලීය.

අයදුම්කරුවන්/නාමයෝජිතයින්ගේ නිසි සහ යෝග්‍ය බව පිළිබඳව සලකා බැලූ සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (3) සහ 103 ව්‍යවස්ථාවන්හි විධිවිධාන යටතේ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා පත් කිරීම සඳහා ඒකමතිකව නිර්දේශ කරන ලදී. ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශය ඉදිරිපත් කිරීමට පෙරාතුව සභාව විසින් නාමිතයා වෙතින් ඔහුට එදිරිව යම් නීති කෘත්‍යයන් පවතීද යන්න පිළිබඳවත්, එවැනි නීති කෘත්‍යයන්හි ස්වභාවය පිළිබඳවත් නිශ්චය කර ගන්නා ලදී.

3.2. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ විධිවිධාන සහ 2023 අංක 28 දරන පනත මගින් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් වශයෙන් පත් කිරීම සඳහා නිසි සහ යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේ කර්තව්‍යය මෙම සභාවට පැවරී ඇත. ඊට අනුකූලව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් වශයෙන් පත් කිරීම සඳහා සලකා බලනු පිණිස, උනන්දුවක් දක්වන හා සුදුසුකම් ලත් තැනැත්තන් වෙතින් ඉල්ලුම්පත් කැඳවමින් සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.

සභාව විසින් එකඟ වන ලද ඉල්ලුම්පත් ආකෘතියක් අනුව එබඳු තැනැත්තන්ගේ විස්තර ලබා ගන්නා ලද අතර, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් ඉල්ලුම්පත්ද නිර්දිෂ්ඨ ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම්පත් ද ඇතුළුව සමස්ත ඉල්ලුම්පත් හැටක් (60) ලැබුණි.

ඉහත සඳහන් කරන ලද පනතේ 4 (1), 4 (2) සහ 5 වගන්තිවල විධිවිධානවලට අනුකූලව ඔවුන්ගේ නිසි සහ යෝග්‍යබව පිළිබඳව සලකා බැලන ලද සභාව විසින් පහත සඳහන් ඉල්ලුම්කරුවන් තිදෙනා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබීම සඳහා ඒකමතිකව නිර්දේශ කරන ලදී:—

I. ගරු විනිසුරු විජේසුන්දර මුදියන්සේලාගේ නීල් පරාක්‍රම ඉද්දවල මහතා;
II. චේතිය ගුණසේකර මහතා; සහ
III. කපුගමගේ බර්නාර්ඩ් රාජපක්ෂ මහතා

තවද, ඉහත සඳහන් පනතේ 4 (3) වගන්තිය ප්‍රකාරව එකී කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ගරු විනිසුරු විජේසුන්දර මුදියන්සේලාගේ නීල් පරාක්‍රම ඉද්දවල මහතා පත් කරනු ලැබීමට නිර්දේශ කිරීම සඳහා සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

3.3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ඊ.ඩබ්ලිව්.එම්.එල්. ඒකනායක මහතාට විදේශ ගතවීම සඳහා නිවාඩු අනුමත කර ඇති බැව දන්වමින් සහ ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම පිණිස සාමාජිකයකු පත් කිරීමේ අවශ්‍යතාව ඇති බව දන්වමින් ජනාධිපති ලේකම්වරයාගේ 2024.03.22 දිනැති ලිපිය සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (2) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව, ඊ.ඩබ්ලිව්.එම්.එල්. ඒකනායක මහතා විදෙස්ගතවී සිටින 2024.04.20 දින සිට 2024.05.06 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා එම කොමිෂන් සභාවේ සාමාජික දයා කමනි රේණුකා ඒකනායක මහත්මිය නිර්දේශ කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ අනුමත කිරීම් / නොකිරීම්

4.1. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු පත් කිරීම

සභාවේ දෙවැනි වාර්තාවෙහි වාර්තා කරන ලද පරිදි, අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු එන්.බී.පී.ඩී.එස්. කරුණාරත්න මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය පිළිබඳ සභාව විසින් සිය ස්ථාවරය ගරු ජනාධිපතිතුමා වෙත සන්නිවේදනය කර තිබුණි.

එයට ප්‍රතිචාර වශයෙන් ගරු ජනාධිපතිතුමා නිර්දේශය නැවත බලන මෙන් සභාවෙන් ඉල්ලා තිබුණි.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (4) ව්‍යවස්ථාව අනුව ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය පිළිබඳව තීරණය කිරීමට විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට සභාව විසින් සාකච්ඡා කර තීරණය කරනු ලැබූ අතර, ඒ අනුව අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු එන්.බී.පී.ඩී.එස්. කරුණාරත්න මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරනු නොලැබිණි.

4.2. අභියාචනාධිකරණයේ සභාපති වශයෙන් වැඩ බැලීම සඳහා පත් කිරීම

අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු එන්.බී.පී.ඩී.එස්. කරුණාරත්න මහතා විදෙස්ගතව සිටින 2024.04.05 දින සිට 2024.05.05 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා අභියාචනාධිකරණ විනිසුරු ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මහතා පත් කිරීමට සලකා බැලීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාව සහ 109 (1) ව්‍යවස්ථාව යටතේ වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශයක් සභාව විසින් සලකා බලන ලදී.

නාමිකයා අභියාචනාධිකරණයේ මීළඟ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා බව ද, සිය වෘත්තියෙහි නිකැලැල් වාර්තාවක් සහිත අයෙකු බව ද සභාව නිරීක්ෂණය කළා ය. එසේම සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව ගරු අග්‍රවිනිශ්චයකාරතුමා වෙතින් ලබා ගන්නා ලද අදහස් ද සැලකිල්ලට ගත් අතර, අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු එන්.බී.පී.ඩී.එස්. කරුණාරත්න මහතා විදෙස්ගතවන 2024.04.05 දින සිට 2024.05.05 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා අභියාචනාධිකරණයේ විනිසුරු ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට ඒකමතිකව තීරණය කළා ය.

4.3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු පත් කිරීම

2024 මාර්තු 01 වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ජනාධිපති නීතිඥ ගරු ඩී.පී.එස් ජයවර්ධන මහතාගේ විශ්‍රාම යෑමෙන් පුරප්පාඩු වූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික තනතුර සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ. මලල්ගොඩ මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ගරු විනිසුරු විජිත් කේ. මලල්ගොඩ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා බව සභාව නිරීක්ෂණය කළා ය. ඊට අනුකූලව, සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාවේ සහ 111ඈ ව්‍යවස්ථාවේ විධිවිධාන සමග නාමිකයාගේ ජීව දත්ත තොරතුරු සලකා බලන ලදුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ජනාධිපති නීතිඥ ගරු විජිත් කේ. මලල්ගොඩ මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

4.4. පොලිස්පති ධුරය සඳහා පත් කිරීම

4.4.1. පොලිස්පති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම

සී.ඩී. වික්‍රමරත්න මහතා විශ්‍රාම යෑමත් සමඟ පුරප්පාඩු වූ පොලිස්පති ධුරය සඳහා සුදුසු නිලධාරියකු පත් කරනු ලබන තෙක් පොලිස්පති තනතුරේ වැඩ බැලීමට මාස තුනක (03) කාලපරිච්ඡේදයක් සඳහා 2023.11.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

රටේ නීතිය හා සාමය පවත්වා ගෙන යෑම පිණිස පුරප්පාඩුවී පවතින පොලිස්පති ධුරය පිරවීමේ අවශ්‍යතාව මෙන්ම මෙම පත් කිරීම මාස තුනක (03) කාලපරිච්ඡේදයක් සඳහා පමණක් ය යන කාරණය සැලකිල්ලට ගත් සභාවේ සාමාජිකයින් ගෙන් බහුතරයක් මාස තුනක (03) කාලපරිච්ඡේදයක් සඳහා 2023.11.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට තීරණය කරන ලදී.

4.4.2. පොලිස්පති ධුරයට ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය

2024 පෙබරවාරි 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයට පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාවේ සාමාජිකයින් සිව් (04) දෙනෙක් විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්.ඩී. තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයට පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කරන ලදී. සාමාජිකයින් දෙදෙනෙක් (02) එම නිර්දේශය අනුමත නොකරන ලද අතර දෙදෙනෙක් (02) කිසිදු තීරණයක් ගැනීමෙන් වැළකී සිටින ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (4) ව්‍යවස්ථාවේ අවශ්‍යතාවය පරිදි ගරු ජනාධිපතිවරයාගේ නිර්දේශය අනුමත කිරීම හෝ අනුමත නොකිරීම යටත් පිරිසෙයින් සභාවේ සාමාජිකයින් පස් (05) දෙනෙකු විසින් සනාථ කර නොමැති බව සභාව නිරීක්ෂණය කළා ය.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර අනෙකුත් ලිඛිත නීති මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පනවන ලද හෝ පවරන ලද කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම

5.1. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජික ධුරයකට පත් කිරීම

2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත අනුව සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ආර්.එන්. අනීස් මහත්මිය පත් කිරීම පිණිස වූ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ 2023.11.29 දිනැති නිර්දේශයට එකඟත්වය පළ කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

5.2. ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සඳහා සාමාජිකයින් පත් කිරීම

ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා සහ ආචාර්ය සුමිත අනුර බණ්ඩාර ඒකනායක මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් දරන ලද ධුරයන්ගෙන් ඉල්ලා අස්වීමත් සමග පුරප්පාඩු වූ එම පාලක මණ්ඩලයේ සාමාජික ධුර සඳහා 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව හෙක්ටර් මනිල් ඇන්තනි ජයසිංහ මහතා සහ රජීව් අමරසූරිය මහතා පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ඉහත කී පනතේ දක්වා තිබෙන සුදුසුකම් හා නුසුදුසුකම් වලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබීමට නාමිකයන් සුදුසු ද යන්න සභාව විසින් නිශ්චයකර බලන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් රජීව් අමරසූරිය මහතා සහ හෙක්ටර් මනිල් ඇන්තනි ජයසිංහ මහතා පත් කරනු පිණිස වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කළා ය. සභාව මෙම නාමයෝජනා අනුමත කරන ලද්දේ නාමිකයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන කවර හෝ මූල්‍ය ආයතනයක සිය සම්බන්ධයක් වේ නම් ඒවායින් ඉවත් විය යුතු බවට සහ නාමිකයන් වශයෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොල සමග ගනුදෙනු නොකළ යුතු බවට වන කොන්දේසියට යටත්ව බව සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත තවදුරටත් දන්වන ලදී.

5.3. අධිභාර අභියාචනා කමිටුව සඳහා සාමාජිකයකු පත් කිරීම

අධිභාර අභියාචනා කමිටුව සඳහා සාමාජිකයන් සිව් (04) දෙනකු පත් කිරීමට සභාව තීරණය කරනු ලැබ තිබූ අතර, අධිභාර අභියාචනා කමිටුවේ ඉතිරි සාමාජික තනතුර සඳහා සුදුසු තැනැත්තකු තෝරා ගනු පිණිස ඉතිරි අයදුම්කරුවන්ගේ ලැයිස්තුව යළි සලකා බැලීය.

අයදුම්කරුවන් පිළිබඳව සලකා බැලූ සභාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අධිභාර අභියාචනා කමිටුවේ සාමාජිකයකු වශයෙන් ඒකනායක ආරච්චිලාගේ වීරසේන මහතා පත් කිරීමට ඒකමතිකව එකඟ විය.

අධිභාර අභියාචනා කමිටුව ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සලස්වන 2018 අංක 19 දරන ජාතික විගණන පනත එකී කමිටුවේ සාමාජිකයින්ගේ ධුර කාලය පිළිබඳ දක්වා නොමැත. එම නිසා, පත් කිරීම් බලධාරියා වශයෙන් සභාව සිය බලතල සලකා බලා සියලුම සාමාජිකයින් අවුරුදු දෙකක (02) කාලපරිච්ඡේදයක් සඳහා පත් කිරීමට තීරණය කළා ය.

කෙසේ වුවද, ඉන් පසුව, අධිභාර අභියාචනා කමිටුවේ සංයුතියට සංශෝධන ඉදිරිපත් කර තිබෙන බවද, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සංශෝධනය කරනු පිණිස එම යෝජනා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බව ද විගණකාධිපතිවරයා විසින් සභාවට දන්වන ලදී. ඊට අනුකූලව, වර්තමාන පනත සංශෝධනය කරන තෙක් මෙම පත් කිරීම් නතර කර කැබීමට සභාව එකඟ විය.

5.4. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත් කිරීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අධ්‍යක්ෂ ජෙනරාල්වරයකු පත් කිරීම සඳහා නිර්දේශ කිරීමට, සුදුසු තැනැත්තන් වෙතින් ඉල්ලුම්පත් කැඳවීමට සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. එම පුවත්පත් දැන්වීමට අනුගාමීව, මුල් පිටපතට අමතර එවන ලද පිටපත් ඉල්ලුම්පත් හා නියමිත ආකෘතියට අනුව නොවූ ඉල්ලුම්පත් ද ඇතුළුව සියලු ඉල්ලුම්පත් දොළහක් (12) ලැබී තිබුණි.

අයදුම්කරුවන් සතු පළපුරුද්ද සහ සුදුසුකම් පිළිබඳව සලකා බලන ලද සභාව, 2023 අංක 28 දරන පනත මගින් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධානවලට අනුකූලව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් පත් කිරීම සඳහා චක්කුඹුරගේ කණිෂ්ක දමිත් විජේරත්න මහතා නිර්දේශ කිරීමට ඒකමතිකව තීරණය කළා ය.

5.5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) සඳහා සාමාජිකයින් පත් කිරීම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (**OMP**) සාමාජිකයින් සිව් (04) දෙනකුගේ ධුරකාලය 2024.04.29 වැනි දින අවසන් විය. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ විධිවිධාන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයින් වශයෙන් සුදුසු තැනැත්තන් ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීම සභාව වෙත පවරයි.

ඊට අනුකූලව, සුදුසුකම් ලත් තැනැත්තන් ගෙන් අයදුම්පත්‍ර කැඳවමින් පුවත්පත් දැන්වීමක් පළ කිරීමට සභාව විසින් තීරණය කරන ලදී. එමෙන්ම, පාර්ලිමේන්තු වෙබ් අඩවිය සහ පාර්ලිමේන්තු සමාජ මාධ්‍ය හරහා ද රජයේ ගැසට්පත්‍රය හරහා ද ප්‍රසිද්ධිය ලබා දෙන ලදී.

6. සභාවේ කාර්යය හා කර්තව්‍ය කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් වූ රීති සකස් කිරීම

නීති කෙටුම්පත් සම්පාදකවරයා සභාවේ සලකා බැලීම සඳහා ප්‍රතිශෝධිත රීති මාලාවක් එවා තිබුනි. එම ප්‍රතිශෝධිත රීති මාලාව සලකා බැලූ සභාව යම් සංශෝධනයන් යෝජනා කරන ලදී. කෙසේ වුවද, සභාවේ සලකා බැලීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකවරයා තවදුරටත් ප්‍රතිශෝධිත කෙටුම්පතක් එවා තිබුණි.

නීති කෙටුම්පත් සම්පාදක වෙතින් ලද ප්‍රතිශෝධිත කෙටුම්පත් රීති සහ සභාව විසින් යෝජනා කරන ලද සංශෝධන පිළිබඳව සභාව විසින් ගරු නීතිපතිවරයා සහ නීති කෙටුම්පත් සම්පාදකවරයා සමග සාකච්ඡා කරන ලදී. සභාවට අවස්ථාවෝචිත පරිදි රීති සංශෝධනය කිරීමට හැකි කරවන විධිවිධාන ඇතුළත් කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

සභාවේ රීති 2023 දෙසැම්බර් 31 වැනි දින ගැසට් පත්‍රයේ පළකරන ලද අතර ගැසට් කරන ලද රීති 2024.01.10 වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම රීති සහ අනුගමනය කරනු ලබන කාර්යපටිපාටි මේ වන විට සභාව විසින් සමාලෝචනයට ලක් කෙරෙමින් පවතී.

7. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා වූ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව සහ ඒ සඳහා දෙන ලද ප්‍රතිචාර පහත පරිදි වේ: –

ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	7
පූර්ණ / අර්ධ වශයෙන් තොරතුරු සපයන ලද ඉල්ලීම් සංඛ්‍යාව	5
ප්‍රතික්ෂේප/ නිෂ්ප්‍රභ කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	2
අභියාචනා සංඛ්‍යාව	1
පිළිතුරු ලබාදෙන ලද අභියාචන සංඛ්‍යාව	1
නිෂ්ප්‍රභ කරන ලද අභියාචන සංඛ්‍යාව	0

8. සභාවේ සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත්‍රවල යොමු අංක

i. SC FR 317/2023
ii. SC FR 318/2023
iii. SC FR 319/2023
iv. SC FR 04/2024
v. SC FR 06/2024
vi. SC FR 12/2024
vii. SC FR 14/2024
viii. SC FR 67/2024
ix. SC FR 75/2024
x. SC FR 80/2024
xi. SC FR 71/2024
xii. SC FR 72/2024
xiii. SC FR 79/2024
xiv. SC FR 82/2024
xv. SC FR 68/2024
xvi. SC FR 84/2024
xvii. SC FR 35/2024
xviii. SC FR 105/2024
xix. SC FR 110/2024
xx. SC FR 113/2024